# වැඩි අස්වනු දෙන අලුත් මිටෝවෝ ප්‍රභෙද

පිලිපිනයේ බෝංචි සහ මෑ දෙමුහුන් නිපකවන පැලැට්වලට බුෂිටාවෝ නාමය ව්‍යවහාර කරනු ලැබේ. පිලිපිනයෙන් ගෙන්වන ලද අලුත් බුෂිටාවෝ වර්ග ඒ කාලයේ මහ ඉලුප්පල්ලම පර්යේෂණ ආයතනයේදී කන්න තුනක් තුලදී [1980ා81 මහ 1981 යල සහ 1981-82 මහ කන්නවලදී] අත්හදා බලන ලදී. මෙම අත් හද බැලීම් වලදී අලුත් බුෂිටාවෝ වර්ග තුනක් ඉතා විශිෂ්ය ප්‍රතිඵල ලැබී ඇත. මෙම වර්ග තුන 1982 යල් කන්නයේදී ප්‍රභේද යෝග්‍යතා පර්යේෂණ [ප්‍රයෝජන] අත්හද බැලීම් සඳහ නිකුත් කරනු ලැබේ.

පහත සඳහන් සටහනෙන් දැනට ජනප්‍රිය බුෂිටාවෝ වර්ගයේ සහ ජයග්‍රාහී වර්ග තුනේ අස්වනු සඳහන් කර ඇත.

| ප්‍රභේදය | අමුකරල් අස්වැන්න හෙක්ටයාර් 1 ට කිලෝග්‍රෑම වලින් | | | |
|---|---|---|---|---|
| | මහ 80–81 | යල 81 | මහ 81–82 | සාමාන්‍ය අස්වැන්න |
| ඊ 9 බී. එස්. එච්. 7 | 16736 | 27916 | 19018 | 21221 |
| බී. එස්. 1 (6–14 ආර්. ඒ. එස්) | 15192 | 19235 | 26180 | 20202 |
| බී. එස්. 3 (පී–14 ආර්. ඒ. එස්.) | 17088 | 19444 | 23449 | 19995 |
| දේශීය බුෂිටාවෝ | 16872 | 17534 | 7291 | 13899 |

ශ්‍රී ලංකාවේ පහතරට තෙත් සහ වියළි කලාපවල අවුරුද්ද මුළුල්ලේම බුෂිටාවෝ, කච්පි, වගාකළ හැක. පිදීමට දින 40–50 පමණ ගතවේ. ළපටි කරල් මෛරීමට පෙර කඩාගෙන ව්‍යාංජන පිළියෙල කළ යුතුයි.